මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council
අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.
web site: www.psc.cp.gov.lk
e-mail: psc.cp.gov@gmail.com
කාර්යාලය காரியாலயம் Office 081-2213097
ලේකම් செயலாளர் Secretary 081-2213096
වට්ස් ඇප් අංකය வட்ஸ்அப் இல. Whatsapp No 070-7213097
ෆැක්ස් பெக்ஸ் Fax 081-2213082

මගේ අංකය எனது இல. My No. CPC/PSC/01/46

ඔබේ අංකය உமது இல Your No.

දිනය திகதி Date 2026.10.26

මධ්‍යම පළාත්
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරු,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
ආයතන ප්‍රධානීන්,

රා.ප.ව. 03/2018 අනුව විශ්‍රාමික රජයේ නිලධරයන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමේදී එවිය යුතු ලිපි ලේඛන හා අවධානයට යොමු කල යුතු කරුණු

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 අනුව හා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2019 අනුව, විශ්‍රාමික රජයේ නිලධරයන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමේදී අදාල අනුමැතිය සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීමේදී අඩුපාඩු නොමැතිව නිවැරදිව ලිපි ලේඛණ ඉදිරිපත් කරන මෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි ආණ්ඩුකාර ලේකම්ගේ අංක GCP/04/03/07 හා 2026.09.23 දිනැති ලිපිය මඟින් මෙම කොමිෂන් සභාව වෙත දන්වා එවා ඇත.

02. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ කටයුතු සිදු කිරීමේදී ගරු කොමිෂන් සභාවේ නිර්දේශයට යොමු කිරීමට ප්‍රථම ලිපිලේඛණ පරීක්ෂා කර, අඩුපාඩු ඇත්නම් නැවත ගෙන්වා ගැනීමෙන් අනතුරුව කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවීමේ අදාල වාර්තා එකින් එක සකස් කල යුතු අතර, ඉන්පසුව එසේ සකස් කරනු ලබන වාර්තා ගරු කොමිෂන් සභාවේ නිර්දේශය සඳහා පූර්ව අවධානයට යොමු කර, ගරු කොමිෂන් සභාවේ නිර්දේශය ලද පසු අනුමැතිය සඳහා සියලු ලිපි ලේඛණ සමඟ අඩුපාඩු රහිතව ගරු ආණ්ඩුකාරතුමන් වෙත යොමු කල යුතුය.

03. එසේ වුවත්, එම නිර්දේශය/ අනුමැතිය ලබා දීම සඳහා වූ ලිපි ලේඛණ මෙම කාර්යාලය වෙත එවීමේදී අඩුපාඩු සහිතව හා අදාල කාලය ඉක්මවීමෙන් පසුවද අප වෙත ලැබෙන අතර, ඒ සඳහා අදාල කාලය තුල ලිපි ලේඛණ පරීක්ෂා කිරීමටත් ප්‍රථම ඒවා ලද සැනින් කොමිෂන් සභාව වෙත කඩිනමින් යොමු කිරීමට සිදු වීමේදී අඩුපාඩු සහිතව එම ලිපිලේඛණ ඉදිරිපත් කිරීම මත ගරු කොමිෂන් සභාව මහත් අපහසුතාවයට පත්වන අවස්ථා නිරීක්ෂණය වේ.

04. ඒ බැවින්, අදාල අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා ආයතන මඟින්, ඉදිරියේදී විශ්‍රාමික රජයේ නිලධරයන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම සඳහා අයදුම්පත් යොමු කිරීමේදී අදාල පිරික්සුම් ලැයිස්තුව පරිදි අදාල ලිපිලේඛණ සියල්ලම නිවැරදිව සම්පූර්ණ කර අදාළ නිර්දේශයන් සමඟ ඉල්ලුම් කරන ලද කාලයට මාස 03 කට ප්‍රථම මුල් පිටපත් කට්ටල 02 ක් මෙම කාර්යාලය වෙත යොමු කරන ලෙස කාරුණිකව දන්වා සිටින අතර, (පිරික්සුම් ලැයිස්තුවද අමුණා එවිය යුතුය) එසේ නොමැති අයදුම්පත් නැවත භරවා යැවීමට කටයුතු කරන බවද, වැඩිදුරටත් දන්වා සිටිමි.

05. අදාල අනුමැතිය/ නිර්දේශය ලබා දීම සඳහා වූ ලිපි ලේඛණ හා ආකෘතිපත්‍ර ලැයිස්තුව මේ සමඟ අමුණා ඇත.

ගරු කොමිෂන් සභාවේ උපදෙස් පරිදි,

කේ.කේ පී.අයි.ඩී.ඩී. විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

පිටපත :- ආණ්ඩුකාර ලේකම්, මධ්‍යම පළාත - ඔබේ අංක GCP/04/03/07 හා 2026.09.23 දිනැති ලිපිය අනුව ඔබගේ කා.දැ.ගැ.ස.

පිරික්සුම් ලැයිස්තුව

රා.ප.ව. 03/2018 අනුව විශ්‍රාමික රජයේ නිලධරයන් නැවත සේවයේ යෙදවීම

නිලධරයාගේ නම : .....

සේවයේ යෙදවීමට නිර්දේශිත ස්ථානය : .....

අනු අංකය	අවශ්‍ය ලිපි ලේඛණ	ඇමුණුම ඇත/නැත
01	නිලධාරියාගේ ජීව දත්ත පත්‍රිකාව	
02	නිලධාරියාගේ ඉල්ලීම් ලිපිය	
03	ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිත ඇමුණුම 01 ආකෘතිය - (EST 01)	
04	රා.ප.ව. 03/2018 මඟින් ඉදිරිපත් කර ඇති ඇමුණුම 02 ආකෘතිය	
05	ආයතන ප්‍රධානියාගේ සාධාරණීකරණ වාර්තාව	
06	මීට පෙර කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් අයෙක් නම්, අවසන් වරට බඳවා ගැනීමේ පත්වීම් ලිපියේ සහතික කරන ලද පිටපත	
07	ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත	
08	උප්පැන්න සහතිකය - මුල් පිටපත	
09	වෛද්‍ය වාර්තාව - මුල් පිටපත (අනුමැතියට මාස 03 ක් ඇතුලත)	
10	නිලධාරියා විශ්‍රාම ගන්වන ලද ලිපියේ සහතික කරන ලද පිටපත	
11	සෞඛ්‍ය සේවයේ තනතුරු සඳහා පමණක් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ පෞද්ගලික නිර්දේශය ලබාගැනීමේ අකෘති පත්‍රය	